# අපේ ගිරා මලිත්තා



තෙහන්සා වර්ණකුලසූරිය

# අපේ ගිරා මලිත්තා

තෙහන්සා වර්ණකුලසූරිය

2025.02.08

978-624-208-818-1

# පිදුම

මෙම පොත මාගේ

දෙමාපියන්ටත්, මට ඥාන

නුවණ ලබා දෙන

ගුරුවරුන්ටත් ආදරයෙන්,

ගෞරවයෙන් පුද කරමි!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දවසක් අපි සෙල්ලම් කර කර ඉන්න කොට ලස්සන ගිරා මලිත්තෙක් ඇවිත් මල් බඳුනේ වැහුවා.



අපි හැමෝම තාත්තාට කිව්වා ඒ ගිරා පැටියාව අල්ල ගමු කියලා. තාත්තා හරිම අමාරුවෙන් උණව අල්ලා ගත්තා.



අපි උඹට කෑම වතුර දුන්නා. තාත්තා ගිරා මලිත්තාට ලස්සන කූඩුවක් අරන් ආවා.



අපි කුරුලු පැටියාව කූඩුවට දාලා පලතුරු කන්න දුන්නා. උගත් ආසාවෙන් පලතුරු කෑවා. අපි උගට චුටි කියලා නම තිබ්බා.



ටික දවසක් ගත වුණා. අහසේ නිදහසේ ඉගිලෙන කුරුල්ලෝ උන්ගේ අනිත් කුරුලු රංචු එක්ක සතුටින් ඉන්නවා දුටුවහම අපිට චූටි ගැන දුකක් දැනුණා.



පැටියා කූඩුවෙන් නිදහස් කරන්න අපි තීරණය කළා. හොඳ දවසක් බලලා උදේ අපි කූඩුවේ දොර ඇරියා. ඒත් ඌ ඉගිලිලා ගියේ නැහැ.



පසු දිනත් කූඩුවේ දොර ඇරියත් ඌ ගියේ නැහැ. තුන්වෙනි දවසේ දොර ඇරියා. ඒ දිනයේදී ඌ ඉගිල්ලා ගියා.



අපිට හරිම දුක හිතුනා. ඌ නිදහස් වුන නිසා

සතුටකුත් හිතේ තිබ්බා.



ඒ දිනයේම හවස පහළ ගෙදර මාමා කතා කරලා කිව්වා අපේ කුරුළු පැටියා වගේ එකෙක් පිලිකන්න පැත්තේ වැටිලා ඉන්නවා කියලා.



අපි හමෝම පහළට දිව්වේ විදුලි වේගයෙන්. අනේ චූට්ට කපුටෝ කොටලා. තටු හැම තැනම විසි වෙලා. උඹ මැරිලා වැටිලා හිටියා.



ආයේ නම් කිසිම දවසක සත්තු කූඩු කරලා හදන්නේ නෑ කියලා අපි හිතා ගත්තා. මිනිසුන්ට වගේම සතුන්ටත් නිදහසේ ජීවත් වීමට අයිතියක් ඇති බව අපි තෙරුම් ගත යුතුය.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්